
# සාධුනාද පූජා කථා





සංස්කරණය

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.**



**2013 වසරේ සමස්ථ ලෝකයේ ප්‍රමුඛ අවධානය දිනූ අතිශය සංවේදී ඡායාරූප 10 අතරට ශ්‍රී ලංකාවෙන් එක්වූ ඡායාරූපය යි මේ. පූජ්‍යතර බෝවත්තේ ඉන්දරතන හිමියන් ගව ඝාතනය හා අන්‍යාගමික කරණයට විරෝධය දක්වමින් කරන ලද මේ ජීවිත පූජාව අපේ යුගයේ ඉතිහාසයට එක්වන අත්‍යුදාර සංසිද්ධියක් වන බව ද ජාත්‍යන්තර ප්‍රවෘත්ති මාධ්‍ය සඳහන් කරයි.**

(http://in.yahoo.com - Yahoo india home page)



# සාධුනාද පූජා කථා

## අංක : 26

*සංස්කරණය*

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.**

# පෙරවදන

ශ්‍රීමත් අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වානයෙන් පසු අප වෙත දායාද වූයේ බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මයයි. ඒ උතුම් ධර්මය  වශයෙන් අසූහාර දහසකි. පිටක වශයෙන් විනය සූත්‍ර අභිධර්මය යැයි තෙවැදෑරම් වෙයි. මෙම උතුම් ත්‍රිපිටකය තුලින් බිඳක් හෝ ධර්මදාන වශයෙන් සැදෑ සිතින් ලේඛන ගත කොට මුද්‍රණය කරවා මහ ජනතාව අතට පත් කිරීමෙන් කියා නිමකළ නොහැකි උතුම් ආනිසංසයක් ලැබෙනු ඇත. මෙම උතුම් ධර්ම දානයෙහි වටිනාකම දන්නා එමෙන්ම කළ ගුණ සලකන පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමිපාණන් වහන්සේ විසින් අපගේ උපන් දිනය වෙනුවෙන් ''සාධුනාද පූජා කථා'' නමින් ඉතා වටිනා දහම් ග්‍රන්ථයක් වශයෙන් මෙම පොත මුද්‍රණය කරන ලදී.

මීට පෙරද උන්වහන්සේ විසින් අපට උපහාර පිණිස දහම් ග්‍රන්ථ කීපයක් මුද්‍රණය කොට මනා ලෙස සම්පාදනය කරන ලදී. අති පූජනීය කහගොල්ලේ ස්වාමීන් වහන්සේගේ උපන් දිනය වෙනුවෙන්ද තවත් වටිනා ග්‍රන්ථයක් සම්පාදනය වෙමින් ඇත. මේ ආකාරයේ වටිනා ධර්ම සේවාවක් ඉටුකරන පූජනීය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේට මේ උතුම් කුසල් බලයෙන් අපල උවඳුරු, කරදර පීඩා දුරින්ම දුරුවී නිදුක් නිරෝගී සුව දිඝාසිරි වේවායි ! ප්‍රාර්ථනා කරමි.

පවත් වී වදාළ අති පූජනීය කඩවැද්දූව ජිනවංස මාහිමිපාණන් වහන්සේද, අති පූජනීය නා උයනේ අරියධම් මාහිමිපාණන් වහන්සේටද, අපවත් වී වදාළ සියලු ස්වාමීන් වහන්සේලාටද අමා නිවන් සුව වේවා ! අකුරේගොඩ ස්වාමීන් වහන්සේගේ පරලෝ සැපත් ආදරණීය මව් දෙමව් පියන් ප්‍රධාන ඔබ අප   සියලු දෙනා නමින් මිය ගිය සියලු ඥාතීන්ට නිවන් සුව පිණිස වේවා ! වර්ථමාන යෝගාශ්‍රාමාධිපති අති පූජනීය පහලවිටිඹල ජනානන්ද මාහිමිපාණන් වහන්සේටද, ලේඛකාධිකාරී පූජනීය කහගොල්ලේ සෝමවංස ස්වාමීන් වහන්සේ ප්‍රධාන ඔබ අප සැම දෙනාට ද, මුද්‍රණ වියදම් දැරූ සියලු පිංවතුන්ටද, ඒ සියලු දෙනා වෙනුවෙන් මියගිය ඥාතීන්ටද දෙවියන් සහිත සියලු ලෝවැසි සත්වයන්ට මෙපිං බලෙන් අමාමහ නිවන් සුව ලැබේවා !

**සියලු දෙනා ලොව සුවපත් වේවා !**

මෙයට,
මෙතැති,
ලග්ගල කල්‍යාණවංස හිමි.

ගල්දූව ආරණ්‍ය,
කහව,
අම්බලන්ගොඩ.
2016.10.14 දින.

**නමො තසස භගවතො අරහතො සමමා සමබුඬසස !!!**

තවද අප භාග්‍යවතුන් වහන්සේ ධර්‍මාරාධනාවෙහි මහා බ්‍රහ්මයාගෙන් ලද සාධුනාද පූජා නම් කවරහද? යත් ඃ-

මෙසේ දීපංකර පාදමූලයෙහි පටන් අනුක්‍රමයෙන් වැඩ බෝ මැඩ වැඩහිඳ මරසෙන් බලබිඳ සම්මා සම්බුඬ රාජ්‍යයට පත්ව උදන් පවත්වා එම වජ්‍රසානයෙහිම ලෝවැඩ වඩා හුන්නාවූ අපගේ භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතා වදාළ සේක. සාරාසංඛ්‍ය මහා කල්ප ලක්‍ෂයක් පුරා ඇස්, ඉස්, මස්, ලේ, අඹු දරුවන් දන්දී බොහෝ දුක් ගෙන බෝධි සම්භාර පුරා මේ වජ්‍රාසනය හා ශ්‍රී මහා බෝධිය ලදිමි. මේ පය්‍යඞ්කය නම් මාගේ ජය පය්‍යඞ්කයය, මේ බෝධිය නම් මාගේ ජය බෝධියයි, මාරයා මවාලූ කල්පාන්ත වාතයක් සේ පවිත ඔසවා දිවෙන ඒසා මහත් සැඩ පවනෙහි පත්‍රාඞ්කුරයකුත් නොසැලින.

මම මෙම ආසනයෙහි බෝ කඳට පිටදී වැඩහිඳ කෙළෙසුන් ගෙවා බුදු බවට පත්ව මුළුලෝ මුදුන්පත් වීමි. මෙකී මෙකී කාරණයෙන් මෙම විදුරස්න මට බොහෝ උපකාරි විය. ඒ හැර නොනැගෙමියි සිතා කෙළ ලක්‍ෂ ගණන් සමවත් සමවැද සත් දවසක් පුරා නොසැලී වැඩහිඳ එම වජ්‍රාසනයෙහිම දවස් යැවූ සේක. එසේ වැඩහිඳිනා කල ඇතැම් දෙවියෝ සිතන්නාහු සිඬාර්ථ කුමාරයාණන් වහන්සේ වජ්‍රසානය හැර නොනැගෙති. තවම බුදුවී නැතුව ඇති. තවම බුඬ කෘතිය නිම නැතිව ඇතිය.

මෙසේ පළමුවන සතියෙහි වජ්‍රසානයෙහි ඵල සමාපත්තියෙන් වැඩහිඳ දෙවියන්ගේ සැකය නැති කරමියි සිතා දෙවන සතියෙහි වජ්‍රසානයෙන් අහසට නැගී මොහොතක් පෙළහර පා දෙවියන්ගේ සැක දුරු කොට ශ්‍රී මහා බෝධියට ඊසාන කොටසට අහසින් බැස මට පිහිට වූ මේ වජ්‍රසානයට සහ ශ්‍රී මහා බෝධියට ප්‍රිය වස්තුවක් පුදමියි සිතා ඇසිපිය නොසොල්වා අනිමිස ලෝචනයෙන් බෝ කඳ බලා සිට ඉන්ද්‍රණීළ මාණික්‍ය සඟලක් පුදන්නාසේ තමන් වහන්සේගේ පස් පැයෙන් දිළිසෙන ඇස් සඟලින් අනිමිස ලෝචන නම් පූජාවක් කොට දින හතක් ධ්‍යාන සුවයෙන් වැඩ සිටි සේක. ඒ වැඩ සිටි ස්ථානය දැන් අනිමිස ලෝචන නම් චෛත්‍යක් තිබේ.

මෙසේ වැඩසිටි ස්ථානයට හා අතරහේ පූර්ව සක්වල මුඛපාඨයෙහි පටන් පශ්චිම සක්වල මුඛපාඨය දක්වා දෙවියෝ රුවන් සක්මණක් මැවූහ. බුදුරජාණන් වහන්සේ මෙසේ දෙවන සතියෙහි අනිමිස ලෝචන පූජාවෙන් දවස් යවා තුන්වන සතියෙහි දෙවියන් මැවූ එම රුවන් සක්මණෙහි සක්මන් කළ සේක. එම ස්ථානය දැන් රත්නචංක්‍රමණ චෛත්‍ය නම් වේ.

ඉන්පසු දෙවියෝ ශ්‍රී මහා බෝධියට වායව්‍ය කොණෙහි රුවන් ගෙයක් මැවූහ. එකල ස්වාමී දරුවෝ තුන්වන සතියෙහි රුවන් සක්මනින් මෙසේ දවස් යවා සතරවන සතියෙහි දෙවියන් මැවූ රුවන් ගෙට සක්මනින් බැස පලක් බැඳ  වැඩසිට රාජ්‍යයක් ලද්දාවූ සක්විති රජකු නොයෙක් රුවණින් පිරූ භාණ්ඩාගාර වල දොරවල් විවෘත කොට සිත් සේ වෙන වෙන නන් විසිතුරු රුවන් බලා අගය කොට ලේකම් බලා සතුටු වන්නා සේ, මාගේ ඒ සඹමී චක්‍රවර්තීන් වහන්සේද බුඹ රාජ්‍යය ලද්දීන් සඹමී නමැති රත්න සමූහයන් සත්දවසක් පුරා විශේෂයෙන් වෙන වෙන බලා වදාළ සේක. කෙසේ බැලූ සේකද ? යත් ඃ-



මම බුඹ රාජ්‍යය ලබා පන්සාළිස් අවුරුද්දක් ඉඳ බුඹ ශ්‍රී විඳිමියි මාගේ ශාසනයෙහිම ශාරිපුත්‍ර ස්ථවිර ප්‍රධාන අසීති මහා ශ්‍රාකාදි කෝටි ගණන් භික්ෂු ගණයා චන්ද්‍ර සූයර්‍ය දිව්‍ය පුත්‍රයන් සේ ශොභාවත්ව මාගේ ශාසනය බබලවති. මාගේ මේ ශාසනය මෙයින් මතු පන්දහසක් අවුරුදු පවතී. මාගේ භික්ෂූන්ට අනුශාසනා පිණිස විනය පිටකය දේශනා කරමි. විනෙය්‍ය ජනයන් නිසා සූත්‍ර පිටකය දේශනා කරමි. මාගේ ප්‍රඥාවේ සාරය දක්වා දිව්‍ය බ්‍රහ්මයන්ට විජම් පිටකය දේශනා කරමි. මෙසේ සංක්ෂෙපයෙන් තුන්පිටකය කල්පනා කොට බලා වෙන වෙනම පරීක්ෂා කරන්නාවූ භාග්‍යවතුන් වහනසේ, තවද විනය පිටකයෙහි පරිජි නම් මේය, පචිතිය නම් මේය, මහවග විනය නම් මේය, සුළුවග නම් වූ විනය නම් මේය, පරිවාර නම් මේය, එයට සමන්තපාසාදිකා නම් වූ විනය අටුවා නම් මේය, සාරාර්ථදීපනි නම් වූ විනය ටීකා වශයෙන් නව අසූදහස් දෙසිය පණස් ග්‍රන්ත සංඛ්‍යාවෙක, යි බලා දැනගත් සේක.

තවද දෙවෙනි සූත්‍ර පිටකයට වැද එහි පඤ්ච මහා සඟියක් දැක පළමුවන දික් සඟියෙහි ශීලස්කන්ද වර්‍ගය නම් මේය, මහා වර්‍ගය නම් මේය, පාළි වර්‍ගය නම් මෙයයි. තුන් වර්‍ගයක් දැක්ක. දෙවන මධ්‍යම සඟියෙහි මුල පණස නම් මේය, මජ්ක්ඩිම පණ්නාස නම් මේය, උපරි පණ්නාසනම් මේයයි තුන් පණ්නාසයක් දැක්ක. තවද තුන්වන සංයුත් සඟියෙහි ශත වර්‍ගය නම් මේය. නිදාන වර්‍ගය නම් මේය, ස්කන්ධ වර්‍ගය නම් මේය, සළායතන වර්‍ගය නම් මේය, මහා වර්‍ගය නම් මේය, පඤ්ච මහා වර්‍ගයක් දුටු සේක.

තවද සතරවන වූ අංගුත්තර සඟියෙහි එක - දෙක තිකනිපාත නම් මේය, චතුක්ක නිපාත නම් මේය, ඡ - සත්තක නිපාත නම් මේය, අට්ඨ - නවක නිපාත නම් මේය, දසෙකාදාස නිපාත නම් යයි ෂට් ප්‍රකාරයක් දැක්ක. තවද පස්වන කුදුගොත් නම් සඟියෙහි චූල නිදේශ නම් මේය, මහා නිර්දෙශ නම් මේය, ප්‍රති සම්භිදා නම් මේය, මහා වර්‍ගය නම් මේය, ජාතක පාඨ නම් මේය, නෙත් පවුරුණු නම් මේයයි හයප්‍රකාරයක් දුටු සේක.

තවද සුමංගල විලාසිනි නම් වූ සූත්‍ර අටුවා මේය, ප්‍රපඤ්ච සුදනී නම් වූ සූත්‍ර අටුවා මේය, සාරාර්ථ ප්‍රකාශනි නම් වූ සූත්‍ර අටුවා මේය, මනොරථ පුරණී නම් වූ සූත්‍ර අටුවා මේය, සද්ධර්ම ජොතිකා නම් වූ සූත්‍ර අටුවා මේය, ප්‍රතිසම්භිදා නම් වූ සූත්‍ර අටුවා මේය, පරමාර්ථ ජෝතිකා නම් වූ සූත්‍ර අටුවා මේය, උදාන නම්වූ සූත්‍ර අටුවා මේය, විමාන වස්තු නම් වූ සූත්‍ර අටුවා මේය, ප්‍රේත වස්තු නම් වූ සූත්‍ර අටුවා මේය, ථෙරගාථා නම් වූ සූත්‍ර අටුවා මේය, ථෙරිගාථා නම් වූ සූත්‍ර අටුවා මේය, චර්‍ය්‍යා පිටක නම් වූ සූත්‍ර අටුවා මේය, බුද්ධ වංශ නම් වූ සූත්‍ර අටුවා මේය, ධම්පියා නම් වූ සූත්‍ර අටුවා මේය, පන්සිය පණස් ජාතක නම් වූ සූත්‍ර අටුවා මේය, විසුද්ධිමාර්ගී නම් වූ සූත්‍ර අටුවා නම් මේය, නෙත් පවුරුණු නම් වූ සූත්‍ර අටුවා නම් මේයයි මෙසේ සූත්‍ර පිටකයට වැද වෙන වෙනම බලා තමන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් වදාරණ පාළි සහ අටුවා කථා භාරලක්‍ෂ එකොළොස් දහස් පන්සියයක් ග්‍රන්තයෙන් සම්පූර්ණ වී යයි මෙසේ සූත්‍ර පිටකය දැක්ක.

තවද අභිධර්ම පිටකයට වැද දම්සඟුණු නම් වූ විජම්පාලි මේය, පුද්ගල ප්‍රඥප්ති නම් වූ විජම්පාලි මේය, කථා වස්තු නම් වූ විජම්පාලි මේය, යමක නම් වූ විජම්පාලි මේය, පට්ඨාන නම් වූ විජම්පාලි මේය, අර්ථසාලිනි නම් වූ විජම්පාලි මේය, සම්මෝහ විනෝදනී නම් වූ විජම්පාලි මේය පඤ්දක නම් වූ විජම්පාලි මේයයි මෙසේ විජම් පිටකයෙහි ශ්‍රී මුඛ පාළි හා අටුවා කථා එක්ලක්‍ෂ විසිදහස් දෙසිය පණස් ග්‍රන්ථ සංඛ්‍යාවකැයි දැක්ක.

මෙසේ තුන් පිටකය මුල පටන් අග දක්වාය. අග පටන් මුල දක්වාය. දෙකෙළවර පටන් මැද දක්වාය. මැද පටන් දෙකෙළවර දක්වා යයි මෙසේ අනුලෝම ප්‍රතිලෝමාදි වශයෙන් සකසා පරීක්‍ෂා කොට බලා වදාර තවද, ඒ මාගේ ධර්ම සංඛ්‍යාව විශේෂයෙන් බලත්නම් රස වසයෙන් එකක් වෙයි, පිටක වශයෙන් තුනක් වෙයි, නිකාය වශයෙන් පහක් වෙයි, අඞ්ග වශයෙන් නවයක් වෙයි, ස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් පමණ වෙයි. ශ්‍රී මුඛ පාළි වශයෙන් මමම කරුණු ලබන්නාවූ දේශනාවෝ දෙලක්‍ෂ හැත්තෑ පන්දහස් දෙසිය පණහක් පමණ ග්‍රන්ථ සංඛ්‍යාවෝ වෙති.



මතු ශ්‍රීලංකාද්වීපයෙහිදී මහා කල්ප ලක්‍ෂයක් පෙරුම්පුරා ආ බුද්ධ ඝෝෂ නම් ආචාර්‍ය්‍ය ස්ථවිරයන් විසින් මාගේ අභිප්‍රාය දැන ලියන ලද අටුවා කථා වශයෙන් තුන් ලක්‍ෂ හැට එක්දහස් හත්සිය පණහක් ග්‍රන්ථ සංඛ්‍යාවෝ පමණ වෙති.

ඒ මාගේ කථාවෝ හැමදෙනම ග්‍රන්ථ සංඛ්‍යාවෙන් හය ලක්‍ෂ තිස්හත් දහසක් පමණ වෙති. භණ්වාර සංඛ්‍යාවෙන් විසිපන් ලක්‍ෂ හතලිස් අටදහසක් බණවර වෙති. අක්‍ෂර ගණනින් දෙකෙළ තුන් ලක්‍ෂ අසූහාරදහසක් අක්‍ෂරයෙන් පිරුණේය. ණය වශයෙන් අසංඛ්‍ය ගණන් ණයය. එ මාගේ සියළු ධර්ම සමූහයෝම අවිනෂ්ඨව පන්දහසක් අවුරුදු පවත්වාහුයයි මෙසේ මාගේ ස්වාමි දරුවෝ **"අනෙක ජාති සංසාරං"** කියා පළමු ඔසොවාගත් ශබ්දයෙහි පටන් ගෙන අවසානයේ පිරිණිවන් මංචකයෙහි නැවත නොනැගිටින සිංහ සෙයියාවෙන් හිඳිමින් **" අප්පමාදෙන භික්ඛවෙ සමපාදෙථ"** යන මේ ශබ්දය අවසන් කොට ඇති සියළු ධර්ම සමූහයන් ඒ දෙවියන් මැවූ රුවන් ගෙයි වැඩහිඳ සතරවන සතිය පුරා මෙනෙහි කොට නිමවා වදාළ සේක. ඒ සද්ධර්මරත්නය වැඩහිඳ සම්මශීනය කළාවූ ස්ථානය දැනට රත්නඝර චෛතිය නම් විය.

මෙසේ බුදුරජාණන් වහන්සේ සද්ධර්ම සම්මශීනයෙන් හතරවන සතිය ගෙවා පස්වන සතියෙහි අජපාල නම් නීග්‍රෙධා මූලයට වැඩ පෙරදිග බලා වැඩහිඳ විමුක්ති සුව විඳ දවස් යවන සේක.

ඒ සමයෙහි මාර දිව්‍ය පුත්‍රයා පැරද ගොස් යහන් මතුයෙහි මුහුණින් හෙව බොහෝ දෙවියන් තමාට කරන නින්දා ඉවසාගත නොහැකිව තමාගේ දිව්‍ය භවනයෙන් සැඟවී ගොස් දඹදිව මාවතක් අයිනේ මගී වේශයක් ගෙන දෙපා දිගු කොට ලා එක් අතක් නිකටට දී කරබාගෙන සිතනුයේ සිද්ධාර්ථ කුමාරයා මාගේ විරෝධය පිටම මහාභිනික්මන් කළේය. අවුරුදු හයක් පුරාවටම මට අවකාශයක් නොදුන්නේය. එතකින් මාගේ විෂය ඉක්මගිය සතුරාට සති හතරකුත් ඉක්ම ගියේය. ඒ සතුරා ඉක්මණින් බණ කියා මා සතු සත්වයන් මට නැති

කර නිවණට ඇද දමති. බොහෝ කාලයක් අඩුවක් නැතිව පිරී තිබුණු මාගේ නරකයන් වලට වැටෙන සත්වයන් වළක්වයි. මතු තබා ඔහු මව්කුස උපන් වේලේ පටන් මේ දක්වාම මාගේ නරකවල ගිනි නිවා මාගෙන් පළි ගනී. ඒ සතුරා කෙසේ විනාශ කරම්දෝයි සිත සිතා ශෝක වෙමින් කාරණා දහසයක් සිත සිතා දහසය මාගී අසුරා ඇඟිල්ලෙන් ඇන්දේය. ඒ කෙසේද යත් ඃ-

''මම සිද්ධාර්ථයාට පාරමිතා දහයෙන්ම අඩුයි. එයත් මගේ ලජ්ජාවට හේතුවක්, ෂඩ් අසාධාරණ ඥානයෙනුත් පරාදයි. මෙම සොළොස් කාරණයන්ට මට වඩා ඒ සිද්ධාර්ථයා ශත සහශ්‍ර ගුණයෙන් බලවත්, ඒකත් මාගේ පරාජයට හේතුවක් උනායි සුසුම් හෙළමින් මාගීයේ ඉරි දහසයක් ඇඳ කරබාගෙන උන්නේය. එකල ඒ මාරයාගේ තණ්හාය, රතිය, රාගාය යි යන දියණියන් තිදෙනා තම පියා දිව්‍ය ප්‍රසාදයෙහි නැති බැව් දුන පියා සිටින ස්ථානය දිවසින් බලා අසුරු සැණින් එතනට පැමිණ '' පියාණනි, ඇයි මේ ශෝකයෙන් ඉන්නේ, ශෝක වෙන්න මොනවද, පියතුමනි වූයේ'' යයි ඇසීය.

එවිට වසවර්ථී මාරයා කියනුයේ ''දරුවෙනි, තෙපි නොදන්නෙහිද? මහණ භවත් ගෞතමයා දස දහසක් සක්වල දෙවියන් බලා සිටියදී මා නොමරා මරා ලුහුබඳවා මගේ මුහුණෙ දූළි ගෑවු බව තොප නොදන්නෙහිද ?'' එවිට දියණියන් තිදෙන කියනුයේ, '' පියාණනි, අපිට නොකියා ඒසා අති විශාල පිරිසක් ගෙන ගොස් වෙහෙසට පත්වූයේ ඇයි ? අපිට කීවානම් එක බල පිරිසකුත් නැතිව අපි තුන් දෙනා පමණක් ගොස් ඔහු කාම බන්ධනයෙන් මුව පොව්වෙකු සේ බැඳ ගෙනවිත් පියාණන්ට පාවා දෙමු'' පියාණන් වහන්ස, සැක නොසිතා දිව්‍යශ්‍රීන් සිටිනු මැනව, ඇසිල්ලකින් ගොස් අප ඔහු ඔබගේ දෙපාමුලට ගෙණෙන අයුරු බලා සිටිනු මැනව, යි කීහ. එවිට මාරයා කියන්නේ '' දරුවෙනි, උඹලා දන්නේ මොනවාද ? සිඬාර්ථ කුමාරයා බොහෝ බලවත්, ආනුභාව තේජස් ඇත්තේය. කිසිවෙකුටක් කිසි දවසක ඔහු ජයගත නොහැකත සොලවාගත හැකි සතෙක් නොවෙයි. මහා ධෛර්‍ය සම්පන්න පුරුෂයෙකි'' යි කීහ.



එබසට දියණියන් තිදෙනා කියන්නේ '' පියාණනි, අපගේ වසවර්තී දිව්‍ය ලෝකයට වඩා වෙනත් කාම භූමියක් නැති බැව් නොදන්නෙහිද ? ජීවිතයක් ඇති පුරුෂයෙක් ඉදිරියෙහි ඇසිල්ලක දර්ශණය වූවො නම් ඔහු කාමයෙන් පොළඹවා ගැනීමට දක්ෂ වූවෝ අපට වඩා වෙනත් කාමාංගනාවෝ කාම ලෝකයෙහි සිටිත්ද ?'' යි කියා තම පියාණන් අස්වසා නැවත දෙව් ලොව යවා එම මාර දූතියන් තිදෙනා ඇසිල්ලෙන් අජපාල නුගරුක මුලට සමීපව නොපෙනී සිට මන්ත්‍රණය කරන්නාහු, පිරිමින්ගේ සිත්නම් නොයෙක් ආකාරය, ඇතැම් අය බාල වයස් කෙල්ලන්ටය කැමතියි, තවත් සමහරු යෞවන කෙල්ලන්ට කැමතියි, තවත් අය මධ්‍යම වයසේ සිත්‍රීන් කෙරෙහි ලොල් වෙති. තවත් අය තරමක වයසක ස්ත්‍රීන්ටත් කැදරයි. ඒනිසා මේ සිද්ධාර්ථ කුමාරයාගේ අදහස් මොන ආකාරයේ ස්ත්‍රීන් කෙරෙහිද යි, බලාගමු යයි කථා කරගත්හ.

දොළොස් හැවිරිදි කුඩා කෙළිරූ, සොළොස් හැවිරිදි පළමුවන යෞවනයෙහි සිටි ස්ත්‍රී රූ එක දරුවන් ලද ස්ත්‍රී රූප, දෙදරුවන් ලද උත්තම ස්ත්‍රී රූ ආදි නොයෙක් රූප සුන්දරියන් වශයෙන් හා නොයෙක් ආකාරයෙන් පෙනී සිටිමින් කෙසේ හෝ අපි පියාණන්ට වූ ලැජ්ජාවෙන් පියා බේරාගෙන ඔහුගේ ශීලයක් බිඳදමා පියාණන් ඉදිරියේ මුව පොව්වෙකු සේ දණ ගස්වන්නෙමි, යි කිය කියා නන් ආකාරයේ ස්වර්ණාභරණයෙන් සැරසී, නොයෙකුත් විලාසිතාවන් මවමින් ගායනයෙන්, වාදනයෙන් මුසපත් කරවීමට බුදුරජාණන් වහන්සේ ඉදිරියෙහි පෙනී සිටිමින් '' යහළු සිද්ධාර්ථ කුමාරයෙනි, තෙපි යෞවන රූ මදයෙන් කාන්තිමත් රූ සපුවක් ඇති කෙනෙකි. තවම තිස්පස් හැවරිදි වයසේ සිට ඔය තපස්දම් හැර දමා මාවෙත එන්න. රන්වන් රූ ඇති කෙනෙකුව නිසා ඕනෑම ස්ත්‍රියක් ඔබට කැමතිය. එමනිසා ඔබට කැමති කැමති අකාරයේ ස්ත්‍රීන් ඔබ වෙනුවෙන් ඔබගේ පහස ගැනීමට බලා සිටිති. එමනිසා තව තවත් ප්‍රමාද නොවී අප ළඟට පැමිණ අපත් සමග සිත්සේ කම් සැප විඳින්න'' යි ආදී නොයෙක් ස්ත්‍රී මායම් පාමින් නොයෙක් නොයෙක් බස් කියමින් අඟ පසඟ පෙන්වමින්, රඟමින්, වයමින්, ගී කියමින්, හඬමින් රඟපෑම් කළහ.

එකල අපගේ බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ පාරමී භූමියෙහි වෙස්සන්තර ආත්ම භාවයේදී තමන් ඉදිරියේ සෙල්ලම් කරමින් සිටි ක්‍රිෂ්ණ ජිනාවන් සිහිපත් කරමින් කරුණාවෙන් අඹාලූ රුවක් සේ හුදු මුදිතාවෙන් මවාලූ රුවක් සේ නොසෙල්වී මහ පොළව සේ වැඩ උන්සේක. ඉන්පසු මැහැළි වේශයක් ගත් තණ්හා නම් දේවතාදූ '' මේ පුරුෂයා එසේ මෙසේ සොලවාලිය නෙහැක්ක, අප කිසිවෙක් දිහාවත් දෑස් කොණ කින්වත් නොබලයි. වෙනත් පුරුෂයෝ නම් ඔවුන්ගේ රූප වර්ණනා කරන කල මදකිපුණු ඇතුන් සේ ස්ත්‍රී ග්‍රහණයට යටත් වෙයි. දැන් ඉතින් මොහු, ඉදිරියේ සිට කෙසේ හෝ මා කරා පොළඹවා ගනිමි'' යි සිතා '' ස්වාමීනි, සිද්ධාර්ථ කුමාරයාණෙනි, ඔබගේ සිද්ධාර්ථ නාමය සියළු ස්ත්‍රීන්ගේ කාමාර්ථයන් ඉෂ්ඨ කරන හෙයින්ම ලදහයි සිතමි. ඔබගේ මේ රන්වන් ශරීරය ලෝකවාසීහු කරුණා, මෛත්‍රීන් සම්පූර්ණ වීයයි කියති. එලෙස කීවත් මම ඔබගේ රූපය අපගේ ආශාවන් ඉටු කරන පඤ්ච කාමයෙන් පිරුණාහයි සිතමි. කාම ස්ත්‍රීන් ඔබගේ තුරුලට බැස කෙළනා පස්මහ තොටුපළකි' යයි කියමි. මෙසේ වූ රූපයකින් මෙවන් වන මැදක කාම ස්ත්‍රීන් නැතිව ඔබ වැන්නකු හුදකලාව විසීම යෝග්‍ය නැත. එමනිසා මෙම වනයෙහි තනියම නොඉන්න, මේ දක්වා කිසිම පුරුෂයකුගේ පහසක් නොලද මාගේ ආසාව සංසිඳාවාලන්න'' ආදී මෙකී නොකී නොයෙකුත් ආකාරයේ ස්ත්‍රී මායාම් පෙන්වමින්ද, කියමින්ද සිටියත් බුදුරජාණන් වහන්සේ නේත්‍ර කොණකින්වත් නොබලමින් කරුණා නිධාන පිළිම වහන්සේ නමක් සේ වැඩ සිටි සේක.

එසේ වීත් නොනැවතුණු මෙම මාර දූතියන් තිදෙන තව තවත් උපක්‍රම යොදවමින්, කියමින් මෙසේද කීවේය. '' සිද්ධාර්ථ කුමාරයාණෙනි, කාමඩාහයෙන් ඔබ වෙත බලාපොරොත්තුවෙන් පැමිණි අපගේ බලාපොරොත්තු ඉෂ්ට කර දෙන මෙන් නැවතත් ඉල්ලමි. එසේ නොවන්නේනම් අපගේ ජීවිත මෙතනම ඔබ ඉදිරියේ හානිකර ගනිමු.'' යි කීහ. එසේ බැරිනම් මියුරු පෙම් බසක් හෝ දී අපගේ සිත් සනසන්නැයි නැවත නැවතත් ස්ත්‍රී මායම් පාමින් තව තවත් එම යක්ෂනියන් උත්සහ ගති. මෙකී නොකී තව තවත් ඉච්ඡාබස් කියවූවත්, රඟපෑවත් කිසි ආකාරයකින්



වත් එම මාරදූතියන්ගේ බලාපොරොත්තු ඉටු නොවූ අතර අපගේ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ඔවුන් දෙස බැලූයේ ජරපත් ලෙඩ වැඳිරියන් පානා විකාර සේ සිතා පිළිකුල් භාවනා වඩමින් අශුභ ලකුණු උපදවා මෛත්‍රී සිතෙන් පින පිනා මහමෙරසේ නිශ්චලව වැඩහුන් සේක.

එම මාරදූතියන් එපමණකින්ම නොනැවතී තව තවත් උපක්‍රම යොදමින් උත්සාහ කරන්නේ දිව්‍යංගනාවන් නිසා මෙතුමාගේ පෙර ආත්ම භාවයන් පරීක්‍ෂා කොට බලා එහි තිබෙන දුර්වල තැන් සොයා නින්දා අපහාස කර හෝ තම පියාණන්ගේ දෙපාමුලට කෙසේ හෝ ගෙනයාමේ උත්සාහය පිණිසමය. එසේ පෙර ආත්ම භාවයන් බලා කියන්නේ,

''කුමරුනි, දැන් අපට ඔබ මුරණ්ඩු වන්නේ ඇයි ? ඔබ පෙර කුස රජව උපන්කල ප්‍රභාවතී බිසව ඔබ හැර පලාගිය වේලේ ඒ සා රාජ්‍යයක් හැර දමා ඇය පසුපස එකදා යොදුන් සියයක් දුර ගිය ගමන මතක නැද්ද ? මාස හතක් දර පැන් ඇද බත් මාලු පිස එම ස්ත්‍රිය නිසා කෝකි වැඩ කොට තොප ගත් දුක් මතක නැද්ද ? තවද වළන් කද කර තබාගෙන හිනි පාමුලහී මලගේ වෙස් ගෙන ඇස පෙරළලා එදා ඔබ වැදහොත් ලෙස මෙදා නැද්ද ? තවද ඔබ හුනු හඬ අසා ප්‍රභාවතී දිව අවුත් කර දිගු කොට මළා දෝයි, නොමලාදෝයි සිතා නාසයට අත තබා බලන කල්හි එම ස්ත්‍රිය දැක ආලය දරාගත නොහැකිව කටපුරා කෙළ ගෙන ඇයගේ මුහුණට ගැසූ සැටි මතක නැද්ද ? තවද එම ස්ත්‍රියම නිසා වීර්යය කරන ඔබ එදා කැහිපට ගසා (අමුඩය) ගෙන මඩ වලේ ඉඳ හැළි වළං හේදූ හැටි මතක නැද්ද ? පෙර සසර ගැහැණුන් කෙරෙහි ආශාවෙන්, ලෝභයෙන් සිටි ඔබ දැන් අපවැනි අංග සම්පූර්ණ ස්ත්‍රීන් කෙරෙහි මඳකුත් ආශාවක් නැත්තේ ඔබගේ වරදක් නොවෙයි. අපගේ අවාසනාව නිසාමය.''

''එසේම පෙර ඔබ රජවූ ජාතියක පඤ්ච කාමය මාමුත් වෙනත් සතකු විඳිය නොහැක්කැයි කියා කාමයෙහි ගිජුව රැහේ සිටි බල්ලන් දක්වා කඩුවෙන් කප කපා කාමෝන්මත්තව එදා හැසිරුණු ආකාරය මතක නැද්ද ? තවත් කාලයක චුල්ල පදුම ජාතකයෙහි ලෝභවූ කාන්තාවක් නිසා රජය

හැර ගොස් ඇයගේ දෙපා බිම ගැවෙන්න නොදෙමි, යි සිතා කරතබාගෙන දුරුමඟ ගෙවා යනදා ඇය පිපාසා කීවේලේ පැන් නැති නිසා උරහිස පලා ලේවලින් පිපාසාවන් සිඳවා ඈ කෙරෙහි තව තවත් කැදර සිතින් රැගෙන ගිය ආකාරය මතක නැද්ද ? තවද ඔබ සුහ ලක්ෂණ ජාතකයෙහි සුහ ලක්ෂණ නම් බිසවුන් කාමයෙන් අන්ධව එදා හිටි හැටි දැන් මතක නැද්ද ? එසේම සංකප්ප ජාතකයෙහි ඔබ බරණැස් රජුගේ අග මෙහෙසියගේ නිරුවත් රූපය දැක ලෝභ උපදවා ආශා කොට එකෙණෙහිම අත්තටු සිඳපු පක්ෂියෙකු ලෙස අහසින් බිමට වැටී එබඳු වූ ධාන්‍ය සුවය හැර උයනට ගොස් හත් දවසක් පුරා නොකා නොබී ඔබ කල ස්ත්‍රී ශෝකය අමතකද ? ( තවත් මෙයාකාර ජාතක කථා තිබේ. ඒවා ඇතුලත් කර නැත.) පෙර ආත්ම භාවයන්හීදි ස්ත්‍රීන් වෙනුවෙන් දුක් විදින්නාවූ තොප දැන් අප සසියයක් ප්‍රිය කරන්නාවූ කාන්තාවන් සැක සිත දරදඬු කරගත යුතු නොවන්නේය. එනිසා අප හිමියනි, අපගේද කාමාශාවන් කරවයි'' නොයෙක් ලෙස ඇවටිලි කලාහුය.

එවේලෙහි ස්වාමි දරුවෝ, නිශ්චලව කරුණා පිඬක් සේ වැඩහිඳ සිතා වදාරණ සේක්. මා රාගාදී කෙලෙස් නසා ලොව්තුරු බුදුව තුන්ලෝ මුදුන් වූ පරිදි මේ ස්ත්‍රීහු නොදන්නාහුය. මොවුන්ට මා අරාගි, අවේෂි, අමෝහි පරිදි හඟවාලම්යි, සිතා වදාරණ සේක්. '' නැගණියෙනි, මොනවා කියා වෙහෙසට පත්වනවාද ? තොපගේ තෛල ස්ත්‍රී ලීලාව අවීතරාගි වූ පුරුෂයන්ටම සුදුසු බව මුත් මා සේ වීතරාගිවූ, වීතදේවෂී වූ, වීතමෝහ වූ, නික්ලේෂී වූ, ශාන්ත දාන්ත වූ අමා මහ නිවන දුටුවන්ට සුදුසු නොවේ'' යයි වදාරා තමන් වහන්සේ වීතරාගී බැව් හඟවා බණ වදාළ සේක. මාර ස්ත්‍රීන් ඒ බණ අසා අප තබා සදෙව් ලොවම දෙවඟණන් පැමිණියත් මොහු කාමපාශයෙන් බදාගත නොහැකි යයි කළකිරී, බුදුරජාණන් වටා සිටි තමන් හයසියයක් දෙනාගේ එක්දහස් දෙසියයක් පමණ අප බුදුරජාණන් වහන්සේ දිසාවට පොව පොවා '' බොල සිඬාර්ථ, තෝ නම් මනුෂ්‍යයෙක් නොවෙයි. ලෙයි ගුණ රස නැති යක්‍ෂයෙක්ද ? නොඑසේනම් උම්මත්තකයෙක්ද ? ඒකාන්තයෙන් තාගේ ශරීරය පස් කඳක් මිස සිතක් නැත්තේමය'' යි ආදී නොයෙකුත් අවලාද අපහාස කරමින්



එහිම අතුරදහන් වූහ.

මෙසේ අපගේ භාග්‍යවතුන් වහන්සේ මාර ස්ත්‍රීන් ජයගෙන ඒ අජපාල නීග්‍රෝධ මූලයෙහි පස්වන සතිය වැඩ හිඳ හයවන සතියෙහි මුචලින්ද නම් විලට වැඩ එම විල් තෙර මහමිදෙල්ල ගසක් මුල වැඩ හුන් සේක. එදා පටන් බුදු බවට පත්වන උත්තමයාණන් වහන්සේලා සහ සක්විති රජවරුන් ලෝකයේ උපදින කල එක් දවසක් වසිනා චාතුර්විපික මහා මේඝ නම් මහා මේඝයක් නන්වා හත්දවසක් ධාරානිපාත වෂීාවක් ඇතිවිය. එම විළෙහි වාසය කරන මුචලින්ද නම් දිව්‍ය නාග රාජයෙක් විලෙන් මතුවී අහස පුරා වසා සිට මහත් වූ වැසි අඳුරු දැක බුදුරජාණන් වහන්සේගේ ශරීරයට වැසි සුළං සීත මැසි මදුරුවන් වළකා මේ සද්දාකාය නිමාවෙන තෙක් පින් රැස් කරමි, යි සිතා අවුත් තථාගතයන් වහන්සේ වටා හත්වාරයක් එතී පෙණ ගොබයෙන් සිරස වසා දින හතම ආරක්ෂා කර ගනිමින් සිටියේය.

එකල බුදුරජාණන් වහන්සේ හයවන සතිය ධාතු කරඬුවක් තුල තැන්පත් වූ ධාතූන් වහන්සේ නමක් සෙයින් එම මුචලින්ද නාග රාජයාගේ දරණ ගබ ධ්‍යාන සුවයෙන් වැඩ හිඳ එයින් ඉවත්ව සත්වන සතියෙහි කිරිපලු වනයට වැද කිරිපලු ගසක් මුල ගල් ආසනයක් මතුපිට නිල්වලා ගබක් පිට දිළිසෙන පුන්සඳක් සේ ධ්‍යාන සුවයෙන් වැඩ සිටි සේක.

මෙසේ සත්වන සිතියෙහි බුදුබවට පත්ව දින 49 ක් පුරා ආහාර කෘත්‍යයක් නැතිව නිවන් සුව වළඳා දින යැවූකල පනස්වනදා උදෑසන අරුණු නැගි වේලෙහි. සක්දෙව් රජු අමා අරුළු සුණු කඩක් ශ්‍රී හස්තයට පිළිගැන්වූ සේක. එම දිව්‍ය වූ අරළු වැළඳූ කල සිරුර පිළිදගුම් විය. ඒකෙණෙහි මාගේ ස්වාමි දරුවෝ යොදුන් පන්සියයක් උස හිමාලයයෙහි සම්පණස් යොදුන් අනවතප්ත විලට වැඩ අනන්තාපරියන්තවූ බුදුරජාණන් වහන්සේලාටම නියතව තිබූ සුගත් නම් තොටට බැස මුව දෝවනය කොට එහි සක්දෙව් රජ පිළිගැන්වූ මෘදුවූ සිනිඳු වූ නාලිය දැහැටි වළඳා නැවත වැඩ එම කිරිපලු ගස මුල වැඩහුන් සේක.

එකල මතු ලෝ පහළ වන බුදුරජාණනස් වහන්සේ නමකට අග්‍ර භෝජනයක් දන්දෙමියි, කල්ප ලක්‍ෂයක් පතා ආ තපස්සු - භල්ලුක නම් වෙළඳ දෙබෑ කෙනෙක් උතුරු දනව්වෙහි සිට ගැල් පන්සියයක් බඩු පුරවාගෙන මධ්‍යම මණ්ඩලයට යන්නාහු කිරිපලු වනයට පැමිණියහ. පෙර ඔවුන්ට නෑ දේවතා දුවක් එම වනයෙහි වසන්නේ වෙළඳ දෙබෑයන් යන්නවුන් දැක ඔවුන් ලවා අද බුදුරජාණන් වහන්සේට දානයක් දෙවා ඔවුන්ට උපකාරයක් කරමියි සිතා ඔවුන් යන්නාවූ ගැල් පන්සියය නාභිය දක්වා එරී ගියහ. අදිනා ගොනුන් දන බිම ඇන නැවත ගියහ. එවිට වෙළඳ දෙබෑයෝ භියට පත්ව මෙම වනයෙහි අධිගෘහිත දෙවි කෙනෙකුන්ගෙ වැඩකයි දැන සුවඳ දුම්, මල්, පහන් පුදා දෙවියන්ට ආරාධනා කළහ. එවිට දේවතා දුව දේව පිරිස පිරිවරා අහසෙහි සිට ඔවුන් භය කරවා පෙනී සිටිමින් බුදුරජාණන් වහන්සේ නමක් අදට දින පණහකට පෙර ලෝ පහළවී මෙම කිරිපලු වනයෙහි වැඩ සිටිති. මේ දක්වා නිරාහාරව වැඩ සිටිනා නිසා තොපටත් මා ඇතුළු මෙම දිව්‍ය සමූහයාටත් හිතසුව පිණිස අග්‍ර භෝජනයක් දීමට අවස්ථාව උදාවී තිබෙන්නේ, එය තොප ලවා දෙනු කැමැත්තෙමු, යී කීහ.

දේවතා දුවගෙන් බුදුරජාණන් වහන්සේ නමක් ගැන ඇසීමට ඔවුන්ට මහත් සතුටක් බවට පත්ව අවස්ථාවේ හැටියට වහාම මී පිඬු ගෙන ගොස් මහත් ගෞරවයෙන් යුතුව බුදුරජාණන් වහන්සේ ඉදිරියේ සිට ආරාධනා කළහ. මහා බ්‍රහ්මයා පිළිගැන්වූ පාත්‍රය සුජාතා දේවියගේ කිරිපිඬු පිළිගත් සැණින් අන්තර්ධානය ගියේය. කිරිපිඬු පිළිගැන්වූ තළිය නාග භවනට ගියේය. එමනිසා බුදුරජාණන් වහන්සේ පාණි පාත්‍රයෙන් (අතේ තිබිණු පාත්‍රය) නොපිළි ගනිති. කුමණ පාත්‍රයකින් පිළිගනිම්දෝහෝ, යි සිතා වදාළ සේක. එකෙණෙහි සසර ජාති ජාතියෙහි දන් දුන්නාවූ චතුමධුර පූණි පාත්‍රයන්ගේ ආනුභාවයෙන් සතර වරම් රජදරුවෝ සතර දෙන ඉන්ද්‍රණීල මාණික්‍යමය වූ පාත්‍ර සතරක් ගෙනාහ.

එවිට අපගේ භාග්‍යවත් ගෞතම සම්මා සම්බුත් රජාණන් වහන්සේ පෙර බුදුරජාණන් වහන්සේලාගේ චාරිත්‍ර බලා එම පාත්‍ර



නොඉවසා වදාළ සේක. නැවත මුංවන් පැහැ ඇති ශෛල පාත්‍ර හතරක් ගෙනවුත් මාගේ පාත්‍රය ගත මැනවයි කියමින් සතරවරම් දෙවි රජවරු හතර දෙනා පාත්‍ර හතර පිළිගැන්වීමට අත් දිගු කර සිටියදී, සම්මා සම්බුදු රජාණන් වහන්සේ හතර දෙනාටම අනුග්‍රහ පිණිස එම පාත්‍ර හතර එකක් වේවා, යි අධිෂ්ඨාන කළ සේක. ඒකෙණෙහිම සතර වරම් රජ දරුවන්ගේ පාත්‍ර හතර එකක් වූ විට පිළිගත් සේක. එවිට එම පාත්‍රයට මීපිඬු පිළි ගෙන සම්මා සම්බුඬත්වයට පත්වූ පසු පළමුවන භෝජනය වළඳා ඒ වෙළඳ දෙබෑයන්ට අනු මෙවෙනි බණ වදාරා බුදු සරණ, දහම් සරණයෙහි පිහිටුවා ඔවුන් බුදු සසුනෙහි උපාසක දෙපල කළ සේක.

ඉන්පසු ඒ වෙළඳ දෙබෑයෝ '' ස්වාමීනි අපට දිනපතා නිතිපතා වැඳ පුදා ගැනීම සඳහා යම්කිසි වස්තුවක් දුන මැනව'' යී කීහ. එවිට ශ්‍රී හස්තයෙන් සිරිස පිරිමැද කේශධාතු මිටක් ඔවුන්ට දුන් සේක. ඔවුන් රුවන් කරඬුවකින් කේශ ධාතු පිළිගෙන රථයෙහි තබා නුවරට ගෙන ගොස් පූජා කරන්නාහු කලෙක ජලයාත්‍රාවෙහි ඇවිද ශ්‍රී ලංකා ද්වීපයට පැමිණි දරපැන් සොයා ගිරිහඬු බැස දා කරඬුව ගලපිට තබා බත් පිස කා යනකල දා කරඬුව තිබූ තැණින් සොළවා ගත නොහැකිව මේ උතුම් ස්ථානයක් යයි සිතා පාෂාණ ගෙඩකින් වසා සුවඳ දුම්, මල් පූජා කර ගියහ.

පසුව එතන ගිරිහඬු නමින් වෙහෙරක් විය. භාග්‍යවතුන් වහන්සේද කිරිපලු ගසමුලින් නැගී අටවන සතියෙහි අජපාල නම් නුග රුක මුල වැඩ හිඳ අනන්තා පරිමේය වූ තමන් වහන්සේගේ සිතිවිළි වූ ක්‍රමයෙන් '' මාගේ දහම ගැඹුරුය, සත්වයන්ගේ නුවණ අල්පය, කෙලශයෝ ඉතා උත්සන්නය, මා බුදුවූ බවමුත් දහම් දෙසීමට කාලය නොවෙයි'' ධර්මගාම්භරත්වයෙන් පසුබට වූ සේක.

ඒකෙණෙහිම සහම්පති මහා බ්‍රහ්ම රාජයා **''නස්සති වත භො ලෝකෝ විනස්සති වත භො ලෝකෝ''** යි කියා දස දහස් සක්වල දිව්‍යය - බ්‍රහ්ම, නාග, සුපණි, ගරුඬා, ගන්ධර්ව, යක්‍ෂ, රාස්සස, උෂ්ණ, වලාහක්‍ර, අභ්‍රවලාහක, ශීත, වලාහක, වාත වලාහක, වස්ස වලාහක, සිඬ, විද්‍යාධරාදි

දිව්‍ය සේනා වෙවුල්යවා මහ හඬින් ගුගුරුවා දස දහසක් සක්වල දෙවියන් රැස්කොට එක් ලක්‍ෂ පණස් දහසක් බ්‍රහ්ම රාජයන් පිරිවරා දස දහසක් සක්වල අනූදහසක් දිව්‍ය රාජ්‍යයන් සමඟ මේ මඟුල් සක්වලට රැස්ව බ්‍රහ්ම රාජතෙම අටසාළිස් වූ ගවු උසින්, සත්ගවු හමාර දිග පතුල් හා දොළොස් ගවු දිග රියන් හා සගව් දිග වියත් හා අඩගවු තැන් වසාල ඇඟිළි ඇතිව, සොළොස් යොදුන් දිග සළු හැඳ, දොළොස් යොදුන් සළු එකාංශ කොට, සොළොස් ගවු මිණි ඔටුනු පැළඳ තමාගේ දස ඇඟිල්ලෙන් දිවු දස රස් කඳින් දස දහසක් සක්වල හිරු දහස් සඳු දහස් නැංගා සේ. ඒකා ලෝක කරමින් ඒ දස දහසක් සක්වල හැම දෙවියන් බඹුන් ගෙන අපගේ බුදුරජාණන් වහන්සේ කරා ඒ අජපාල මුලයට පැමිණ තමාගේ දොළොස් ගවු උස දකුණු දණ මඬල නමා උක්කුටියෙන් හිඳ සගවු පමණ විශාරද වූ, දොහොත් මුදුනේ තබා ගෙන,

''ස්වාමීනි, බුදුරජාණන් වහන්සේ නමක් ලෝ පහළ වීම මහා කල්ප අසංඛ්‍යයකිනුත් ඉතා දුළීභ වන්නේය. ඔබ වහන්සේ මේ සතර අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පුරා පාරමිතා ධර්‍මයන් පුරා දුක්වින්දේ දම්සක් පවත්වා සියළු සත්වයන් සංසාර දුකෙන් මුදවමියි සිතා වේද, එසේ වූ ඔබ වහන්සේ දැන් සඬර්‍මචක්‍රවර්තීව ධර්‍මචක්‍රය නොපවත්වමියි සිතූයේ නොයේද, ඔබ වහන්සේගේ දේශනා නමැති රශ්මීන් ප්‍රබුඬාකරව හිඳිනා විනෙයජාතන පද්මයෝ අසංඛ්‍ය ගණන ඔබ වහන්සේගේ ධර්‍ම චක්‍රය ඉක්ම පවත්නේවී නම් මම මාගේ ආඥා චක්‍රයෙන් හික්මවා දෙමි,යි

**''දෙසෙථ මුනින්‍ෙදා ධම්මං දෙසෙථ භගවා ධම්මං''**

යනාදීන් කියා ධර්‍ම දේශනාවට ආරාධනා කළේය.

එකල මහා බ්‍රහ්මයාගේ ආරාධනා අසා ධර්‍මය දේශනා කෙරෙමි, යි බ්‍රහ්මයාට ප්‍රතිඥා දුන් සේක. එවිට ඒ සහම්පති මහා බ්‍රහ්මයා සතුටු වූයේ මුළු ලොවට ඇසෙන සේ තුන් වරක් සාධුකාර නාද පූජා කළේය. ඔහුගේ එම ශබ්ද ඝෝෂාව සමඟම දහ  දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්ම රාජයෝද සතුටු




වූවාහු දොහොත් මුදුන් දී දෙලක්‍ෂ හතලිස් දහසක් සාධුකාර පූජා කර එහිම අතුරුදහන් වූහ.

මෙසේ තමන් වහන්සේ බුඬත්වයට පත්ව ධර්‍මදේශනා කෙරෙමි,යි ප්‍රතිඥා දුන් පමණකින් දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මයන් කළාවූ මේසා සුදුසු මහත් වූ පූජා ලත් හෙයිනුත් මෙසේ කළාවූ පූජා විඳීමට සුදුසු හෙයිනුත් තුන් ලොවට ගුරුවූ අපගේ භාග්‍යවත් අර්හත් ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේ මේ මේ කාරණයෙනුත් අර්හත් වන සේක.

මේ පූජාවලියෙහි බුදුරාණන් වහන්සේ සද්ධර්මාරාධනාවෙහි අජපාල නීග්‍රෝධ මූලියෙහිදී මහා බ්‍රහ්මයාගෙන් ලද සාධු නාද පූජා කථා නම් වූ දොළොස්වන පරිච්ඡේදය නිමි.

# හම්බන්තොට කැලේ සිටි එකම දළ ඇතාත් වෙඩි තබා මරා දමලා

## දළ යුගළ ගලවාගන්න බැරිවෙලා



හම්බන්තොට කැලයේ සිටි එකම දළ ඇතාත් වෙඩි පහකරට ලක්ව හම්බන්තොට ඉලුක්පැලැස්ස සිඳීගිය වැවේ මැරී වැටී සිටියදී පෙරේදා (7) වැනිදා සවස සොයාගත් බව හම්බන්තොට වනජීවී කාර්යාලයේ අඩවි සහකාර විජයකුමාර මහතා පැවසීය.

මිය ගිය ඇතැගේ දළ යුගළ ගලවාගෙන යෑමට නොහැකිවී ඇතැයිද විජයකුමාර මහතා කීය. මීට දින කීපයකට පෙර මෙම ඇතාගේ දකුණු පාදය පෙදෙසට වෙඩි වැදී ඇති අතර, වෙඩි කාගෙනම ඇතා ජලය බීමට ඉලුක්වැවට පැමිණ ඇත. නියඟය නිසා වැව සම්පූර්ණයෙන්ම සිඳී ඉරිතැලී ගොස් නිසා බීමට ජල බිඳක් නොමැතිව දැඩි වේදනාවෙන් අවට ගස් කොළන් විනාශ කරගෙන ඇතා මියගොස් සිටි බව වන ජීවී කාර්යාලය කියයි.

ප්‍රදේශයේ ගවයින් සොයා බලාගන්නා ගව හිමියන් ඇතා වැටී සිටිනු දැක හම්බන්තොට වනජීවී නිලධාරී කාර්යාලයට දැනුදීමෙන් පසුව පෙරේදා (7) සවස ඇතාගේ සිරුර සොයා වනජීවී නිලධාරීන් එම ස්ථානයට පිටත්ව ගොස් තිබේ.



ඒ වනවිට ඇතාගේ දළ කපාගෙන යෑමට කිසිවකුට හැකියාවක් තිබී නොමැති හෙයින් ඇතාගේ සිරුරට ආරක්ෂාව සඳහා පෙරේදා (1) රාත්‍රී සිට වනජීවී නලධාරීහු මුරකාවල් යොදා තිබිණි. අඩි 3 ක් පමණ දිග ඉතා හොඳින් වැඩී ඇති දළ යුගල සහිත මෙම ඇතාගේ වයස අවුරුදු 30 ක් පමණ වන බවත්, හම්බන්තොට හා ඒ අවට කැලයේ සිටි එකම දළ ඇතා මෙම සතා බවත් වනජීවී නිළධාරීහු මෙන්ම ප්‍රදේශවාසීහු ද පවසති.

ඇතාට වෙඩි තබා ඇත්තේ දළ යුගළ කපා ගැනීමට බවත්, ඇතා හිටපු ස්ථානය සම්බන්ධව තොරතුරු නොදත් හෙයින් දළ යුගළ කපාගැනීමට නොහැකි වූ බවත් වනජීවී නිලධාරීහු සැක කරති. ඉකුත් 4 වැනිදා ගැබ්බර ඇතින්නියක් සිය පැටවා බිහිකිරීමට ආසන්නව සිටියදී හම්බන්තොට පන්වැව ප්‍රදේශයේදී වෙඩි තබා මරා දමා තිබියදී පැටවා ඇතින්නියගේ උදරය පලා ගෙන එළියට පැමිණ තිබිණි.

පවතින නියගය නිසා වල් අලින් ඇතුළු අනෙකුත් වන සතුන් දඩයම් කිරීමට නීතිවිරෝධී ගිනි අවි භාවිතය හම්බන්තොට ප්‍රදේශයේ බොහෝ සෙයින් වැඩිවී ඇතැයි වනජීවී නිලධාරීහු කියති.වල් අලින්ට හා ජලය සොයා එන වනසතුන්ට වෙඩි තබා මෙලෙස ඝාතනය කිරීම නතර කිරීමේ කිසිදු වැඩ පිළිවෙලක් මේ වන තෙක් ආරම්භ කර නැතැයි ප්‍රදේශවාසීහු කියති. උඩවළව ඇත් අතුරු සෙවනේ පශු වෛද්‍ය විජිත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් මියගිය ඇතැගේ මරණ පරීක්ෂණය ඊයේ (8) පැවැත්විණි.හම්බන්තොට වනජීවී කාර්යාලයේ අඩවි ආරක්ෂක ඩබ්.එම්. ගුණතුංග, සහකාර අඩවි ආරක්ෂක විජයකුමාර, වනසත්ව නියාමකවරුන් වන සුමතිපාල ඒකනායක, එල්.ජී. ධම්මික, එස් සිරිවර්ධන, දිමුතු මංජුල බණ්ඩා, රියැදුරු ගුණසිරි යන නිලධාරීහු සිද්ධිය සම්බන්ධව පරීක්ෂණ පවත්වති.

2014 අගෝස්තු මස 9 වැනි සෙනසුරාදා
ලංකාදීප.
(ඡායාරූපය සහ සටහන අම්බලන්ගොඩ සනත් ගමගේ)

## පසුවදන

මෙම කථා වස්තුවෙන් අපට ගතහැකි ආදර්ශ නම් ඃ-

පාරමිතා පුරණවාය කියන්නේ යම්කිසි විභාගයක් සඳහා පුහුණු වීමයි. පුහුණුවෙන් පසු විභාගය පාස්වීම යනු නියත විවරණ ශ්‍රී ලැබීමයි. මේ සක්වල නොව, දස දහසක් සක්වල නොව අනන්ත අප්‍රමාණ සක්වල වූවත් අතිශයින් දුෂ්කරම අතිශයින් චිත්ත පීඩා, කායික පීඩා, සිතුවත් ඇඟ කිළිපොලා යන, මෙතෙකයි සීමා කාලයක් නොමැති සසර දුක, භිය පෙනි පෙනී තමන් සසරින් මිදීමට නොව පර දුක්ඛ තම දුක්ඛ සේ සිතන දුර්ලභ ගණයේ වීර පුරුෂයන්ටම පමණක් සීමාවූ විභාගයකි. ඒ කෙසේද යත් ඃ-

මෙයට විසි අසංඛ්‍යකල්ප ලක්ෂයකට පෙර තම මවගෙන් ලත් විවරණය ප්‍රධාන කොට ගෙන පුරාණ දීපංකර බුදුරජාණන් වහන්සේගෙන් ලත් අනියත විවරණයත් උපයෝගි කරගෙන පළමු කොට ස්ත්‍රී ආත්ම භාවයෙන් මිදී එතැන් පටන් සොළසා අසංඛ්‍යකල්පයක් පුරා පාරමිතා නමැති විභාගයෙන් පාස්වී මෙයට සතර අසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර සාරමණ්ඩ නම් කල්පයෙහිසදි පහළ වූ තණ්හන්කර, මේධංකර, සරණංකර යන බුදුරාජාණන් වහන්සේලාගෙන් පුරණ ලද පාරමිතා වල අඩු තැන් සපුරා එම කල්පයෙහි සතරවන අතුරු කල පහළ වූ දීපංකර නම් සර්වඥයන් වහන්සේගෙන් ලත් නියත විවරණය යනු විභාගයෙන් පාස්වීම යනුයි. ඒ කෙසේද යත් ඃ-

පළමුවන ස්ත්‍රී ආත්මයෙන් මිදී දෙවනුව සේරිවාණිජ ජාතකයෙන් ආරම්භ වූ සාන්ති පාරමිතාව සාන්තිවාදී තාපසව උපන් ආත්මයේ කලා වූ රජුගෙන් සාන්තිවාදී පාරමිතාව සම්පූර්ණ කිරීම, පළමු ව්‍යාඝ්‍ර දේනුවට ගොදුරු වූ ආත්මයෙන් ආරම්භ වුනු දාන පාරමිතාව වෙසතුරු ආත්මයෙන් සම්පූර්ණ කිරීම. මෙකී නොකී සියල්ලටම වඩා මෙම දහම් ග්‍රන්තයට ඇතුලත් වී තිබෙන මාර දූතියන්ගේ පොළඹවා ගැනීමට අසු නොවී කිසිම පුදුම වීමට හේතුවක් නැත්තේ සම්මා සම්බුඬත්වයට පත්වූ



උත්තමයාණන් වහන්සේ නමක් වීම.

එසේම මෙම ග්‍රන්ථයට ඇතුලත්ව තිබෙන පෙර ආත්ම භාවයෙක රජෙක්ව සිටියදී කම්සැප මා හැර මාගේ රාජ්‍යයෙහ් තිරිසන් සතෙකුටවත් විඳීමට තහනම් කරපු රජතුමාම තවත් ආත්ම භාවයක (සංකප්ප ජාතකය) බරණැස් රජතුමාගේ අග බිසවගේ නිර්වස්ත්‍ර රූපය දැක කාමරාගයෙන් මත්ව ඇය සමඟ අනාචාරයේ හැසිරුණු එම ධ්‍යානලාභි තාපසයාණන් වහන්සේ වූ අපමහා බෝසතාණන් වහන්සේ පසුව තෙලපත්ත ජාතකයෙහිදී යකින්නියන් අධිගෘහිත වනාන්තරයෙන් යාමේදී තමා සමඟ එකට පැමිණි යහළුවන් පස්දෙනාත් තමා තනියම ගිය රාජ්‍යයේ රජතුමාත් කාමරාගයෙන් මත් කරවා මරාකාපු අප බෝසත් කුමාරයා එම ආත්ම භාවයෙන් අජපාල නුග රුක මුලදී කාමරාගයේ අංක එක වූ වසවර්තී මාරදිව්‍ය පුත්‍රයාගේ මරඟණන්ගේ අඟපසඟ, රඟපෑම්, ගීත, වාදන බැළුවේ වයෝවෘධ ලෙඩ කුෂ්ඨ රෝග වැළඳුණු බැල්ලියන් තිදෙනෙකුගේ හැසරීම් ලෙසයි.

එය සසර පුරා (නියත විවරණ ලබන ආත්මය දක්වා පුරුදු පුහුණු වීම් වලින් සමර්ථතාවය ලබාගැනීම) ඒ නිසා තමයි බුදුබවට පත්වන අධිවීර්යවන්ත උත්තමයන් වහන්සේලා එකී පුරුදු පුහුණු වීම් සඳහා සතර, අට, සොළසා සංඛ කල්ප දක්වා නියත විවරණ ලැබගෙන අන්තිම ආත්මයට පත්වන්නේ එක් අසංඛ්‍යයක් තුලදී මේ ලියන මමත් කියවන ඔබත් අසා සිටින ඔබත් මනුෂ්‍ය ආත්ම භායන්හිදී ලැබූ උත්පත්ති සංඛ්‍යාව අනුව හිමාල කන්දට වඩා උස ඇටකටු එකී, එකී, කල්ප වල එකතු කලා නම් එයටත් වඩා උසට ඇත.

ප්‍රියයන්ගෙන් වෙන්වීම් වෙනුවෙන් හඬපු කඳුළු සතර මහා සාගරයන්ගෙන් එක් සාගරයක ජලයට වඩා වැඩි ඇති. එක් අසංඛ්‍යයක් තුල තිරිසන් ආත්ම භාව වල ඉපිද වැඟිරූ ලේ සතර සාගරයෙන් එක් සාගරයක ජලය අභිභවා යන්න ඇති. එමනිසා අප තවමත් එතනමයි. අටවිසි බුදුරජාණන් වහන්සේලා ඒවා ප්‍රයෝජනයට ගත් නිසා තමයි

සම්පූර්ණයෙන්ම සසර ගමනට නැවතීමේ තිත තැබුවේ. එසේම එම බුදුරජාණන් වහන්සේලාගේ ආදශීය ගත් ධර්මාවබෝධය ලබාගත් මෙතෙකැයි කිව නොහැකි සත්ව සංහතියක් නිවන් පුරට වැඩියේය.

අපිට තිබෙන්නේ මේවා කියවා බලා ඉතිහාසයේ කුණු කූඩවට යැවීම නොව මෙම දහම් පඬුරෙන් ගත හැකි ආදශීය ගෙන තවත් එවන් ධර්ම ග්‍රන්ථයකින් හෝ ආදශීමත් චරිතයක් හෝ ගෙන බුදුබව හෝ ඉක්මන් භවයකින් දුක් සසර ගමන නිමා කිරීමයි. මෙහි සඳහන් පස්වැනිව වැඩ සිටි අජපාල නීග්‍රෝධ මූලයේහිදී එකී මාරදූතියන්ට දිව්‍ය වූවත් කල්ප අසංඛ්‍ය ගණන් ඈතට දැකීමේ ශක්තියක් බලයක් නැත. එයට අපට මාගේ අතීත වැරදි හැසරීම් මා විසින්මත්, පිරිණිවීමට අවසර ඉල්ලා පැමිණි රාහුල මාතාවන් නොහොත් යශෝධරා, සතවිරින් වහන්සේලාවත්, එයට අමතරව චිංචිමානවිකාව ලවාත් පන්සිය පණස් ජාතක කථා වස්තුවෙන් කිසිවෙක් නොව ශ්‍රී මුඛ දේශනාවන් මඟින්ම පෙන්වා දුන් ආකාරයට මාරදූතිය ලවා ඃ-

තමන් වහන්සේගේ සසර ගමනේදී වූ නින්දා අපහාස, ස්ත්‍රීන්ට වසඟවීම ආදිය නිසා විඳි ගැහැට සියළුම ලෝක සත්වයාගේ හිතසුව පිණිස සසර ඇලීම්, භව තෘෂ්ණාවන් නිසා වන දුක්ඛයන් මැනවින් පෙන්වාදීමත් ආදරණීය පියෙක් තමාගේ පෙර වැරදි පෙන්වාදී එයින් මිදෙන ආදශීයත්, මම මෙතරම් බ්‍රහ්මචාරියෙක් වූවාට පෙර සිටියේ මෙවන් තත්වයක බව එම මරඟනන් ලවාම ප්‍රකාශ කරවා තව තවත් නින්දා අපහාස කලත් එකියන් දෙස බැලුවේ වෙසතුරු ආත්ම භාවයේ සිටි සිඟිති සුරතල් ක්‍රිෂ්ණජිනා දෙස බලන ආකාරයටය. අපි මේවායින් ගත යුතු ආදශීය නම් අනියම් පෙම් සබඳතා බිඳවැටීම නිසා ස්ත්‍රීන් පුරුෂයන් වෙනත් පුරුෂයන් ස්ත්‍රීන් වෙනත් ප්‍රමාණයට වඩා බලාපොරොත්තු විශ්වාස නොතබා මධ්‍යස්තව සිතා තිරිසනුන්ටත් අන්තව කරන ජීවිත හානි ආදී අපරාධයන්ගෙන් වැළකී යහපත් රටට, ජාතියට,ආගමට ගෞරවයක් වන ආකාරයට වග කිවයුතු ආදශීමත් චරිතයක් බවට පත්වේවා.



මෙම දහම් ග්‍රන්ථය සම්පාදනය කරනු ලැබූයේ ක්‍රිස්තු වර්ෂ 2010 ජුනි මාසයේ දූරණියගල ශෛලාරාමයෙහි වැඩ සිටි කෙටි කාලය තුලදීය. මෙම ග්‍රන්ථය නැවත පිටපත් කලේ ක්‍රිස්තු වර්ෂ 2014 ඔක්තොම්බර් මාසයේ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම මූලස්ථානය වන ගල්දූව අම්බලන්ගොඩදීය. මෙතෙක් කල් මෙය එළිදැක්වීමට ප්‍රමාද වූයේ අනුග්‍රහකයින් නොමැතිවීම නිසයි.

දූරණියගල වැඩ සිටි කෙටි කාලය තුල එහි බෝධීන් වහන්සේට ඉහළින් කඳු ගැටේ තිබිණු ජරාවාසයට ගිය කුටියක් තුල අපවත් වූ ස්වාමීන් වහන්සේ නමකගේ මිනී අළු බඳුනක් ඒ තුල අවුරුදු 5 ට වැඩි කාලයක් තිබුනු නිසා කිසිවෙක් ඒ දෙසට ගියේවත් නැත. මම එහි වැඩ සිටි කාලය තුල එම අළු කලය ඉවත් කර දායක මහතෙකුගේ සහායෙන් සුද්‍ර පවිත්‍ර කර හුණු ගා වටේ පරිසරයත් යම් ප්‍රමාණයකින් සකස්කර මාගේ ආවාසය බවට පත්කර ගතිමි. එහි ප්‍රධාන දායක මහතා වන ගැමි රස හෝටලයේ අධිපතිතුමා මා හමුවීමට පැමිණි බොහෝ සෙයින් සතුටට පත්වීමත්, මට උදව් උපකාර කරලත් එතුමාට මගෙන් විය යුතු ධර්මදානය දීමට බාධාවන් තිබුණු නිසා එතුමාට මෙලොව වශයෙන් දිට්ඨ ධම්ම වේදණීය වශයෙන් විපාක දෙන තම පියාණන් ඔත්පලව සිටීම ආදරණීය ස්වාමි දියණියත් එවන් තත්වයකට වැටී තිබුණත් ඒවා පෙන්වාදීමට තිබුණු බාහිර ප්‍රශ්ණ නිසා වැඩිකල් නොගොස් මටද එම ස්ථානයෙන් යාමට සිදුවිය.

මීට මෙතැති,
පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි,
අලව්වත්ත සණස බැංකුව භාරේ,
අසෝකා ආරණ්‍ය සේනාසන පාර,
අලව්ව.
13.11.2017

**මහණෙනි බලනු රන් මිණි මුතු දී ගත්ත**
**සහවාසය ලැබුව සිරිමා ඇයි තිත්ත**

පුන් සිසි එබෙයි අඹරේ පුළුමකට වෙලා
සං ගීතවත් වෙයි කරළිය කිකිණි සලා
නැං වෙන සරා ගීයෙන් වී සැවොම මුලා
නින්දක් නොමැති නෙත් ඇත ඇගෙ රැඟුම බලා

මද හස සමඟ මුසු වූ නෙතඟනි බැල්ම
පද වන මිණි මෙවුල ඉන් විහිදෙන කැල්ම
බැඳ ලයි රසවතුන් ඇගෙ රුසිරෙහි ඇල්ම
පුද දෙයි තිළිණ පාමුල එළිවෙන කල්ම

රඟ පා අනඟ මන්මත් කළ මෝහිනිය
නැඟ නියි 'ජීවකගේ' සිරිමා ශෝභනිය
ඉඟ සුඟ සලනු දුටු සලෙලුන් දේහනිය
දඟ කරනවලු ලැබුමට රස රාජිනිය

සල් ගොමුවක උදේ විල්තෙර සවස කල
ගැල් වෙයි සුවඳ වන්දන සිටු පියෙස් තුල
දූල් වෙන පහන් තරුණයිනගේ රසැස් වල
මල් හීසර විදිනවලු මේ දවස් වල

එන් කම් වලින් හෙබි සළු පිළි නිති ඇන්ඳ
චන් දන උලා තන තිසරුන් මුතු බැන්ද
පින් ලඳ රජගහේ පස්කම් සැප වින්ද
සුන් විය හදිසියේ ලෙඩකින් පණ කෙන්ද



දැක රස කාමිනිය රූපෙට වසඟ උන
එක සඟ නමක් සිටියා පෙම් මතින මන
දූක ඉවසිය නොහිව ඇය මරු ගිලපු දින
හැති ලුනි සයනෙ උපවාසය කරන මෙන

දම් රස බෙදන සතහට බුදු සමිඳු මගේ
ලං විය 'වේළු වනයට' දූක රැඳුන යුගේ
දන් වා රජුට රකිනට මළ සිරුර ඇගේ
ගෙන් විය නුවරු සොහොනට කුතුහලය ඇගේ

තුන් ලෝ පියා සඟගන පිරි වරාගෙන
දූන් සොහොනෙහිය මෙත් කරුණා දයාවෙන
අන් තිම කෙළවරෙහි සිය හිස නමාගෙන
පෙම් කල සඟ නමද ඇත නෙත් තෙමාගෙන

තෙදි නක් ගෙවී ගිය මළකුණ දුගඳ හමයි
රෙදි කඩ සැරව හා මුසුවී පොළොව තෙමයි
මදි පාඩුවට පනුවන් සිලි සිලියෙ බමයි
ඉදි මුන සිරුර නිලමැසි රජ දහන තමයි

දූන ගෙන බුදු මැණික රැඳි පිළිකුල හොඳට
නැණ සින් බලා පිළියම් තනමින් එයට
දනහට ඇසෙන සේ අමතා මහ රජුට
පැණ යක් අසයි ගොස් ඇගෙ මළකුන ලඟට

මහ රජ කියනු මැන මේ 'සිරිමා වන්ද'
එහෙ මයි බුදු පියේ පිළිවිසියේ කිම්ද?
දහ සක් ගෙවා රසවෙතකුට මන බැන්ද
සහ කාරියට ගන්නට නොකියනු මන්ද?

රන් දහසක් ගෙවා සිරිමා ලැබ ගන්න
එන් නකො දනවතෙක් මේ පිරිසෙහි ඉන්න
දූන් වුව විටදි බුදු අණ මහ රජු ඔන්න
සන් සුන් විය කව්රුත් සෙල් රූ වැන්න

ටික ටික අඩු කලද මිණි සිරිමා වන්නේ
එක දනවතෙකුවත් නැහැ ඇය ඉල් ලන්නේ
නික මට ගන්න බල කෙරුවද නෑ ගන්නේ
රැක ගෙන හිනා දැතින් නුවරුන් ඉන්නේ

මහණෙනි බලනු රන් මිණි මුතු දී ගත්ත
සහ වාසය ලැබුව සිරිමා ඇයි තිත්ත
නැහැ කිසිවෙක් බලන ඇගේ දේහය පැත්ත
දහ මක් දෙසයි බුදු හිමි මතු කොට ඇත්ත

පට පිළියෙන් වැසුව වන්දන සුවඳ කවා
නට වන සිරුර අනුරාගෙන් උදය හවා
හෙට කුණු ගොඩකි ඉවසුනු බෑ දුගඳ පවා
'කට යුතු කරව්' මහණෙනි සිහි නුවණ මවා

**චතුපිටිවල - සිරි විල්සන්**